**ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව**
**------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මතය**
**------**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ඔක්තෝබර් 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
**----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව  දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා  අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.  වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූෂ්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ  අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල  උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 ආදායම් කළමනාකරණය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ආදායම් සංකේත 20.02.03 - ලාභ ආදායම්** | | |
| (i) 2019 වර්ෂය සඳහා රු.මිලියන 63,900 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබූ අතර තථ්‍ය ආදායම රු.මිලියන 22,833 ක් පමණක් විය. එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 36 කි. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කළ යුතුවේ. | ලාභ ආදායම් ඇස්තමේන්තුව රුපියල් මිලියන 41,066 ක් ලෙස සංශෝධනය කර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළද එවකට පැවති දේශපාලනික තත්ත්වය හේතුවෙන් සහ එම වර්ෂයේ සිදු වූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් එම සශෝධිත ඇස්තමේන්තුව පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට නොහැකි විය. |
| (ii) ආයතන 08 ක් සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත ලාභ ආදායමට සාපේක්ෂව තථ්‍ය ආදායමේ අඩුවීම ප්‍රතිශතයක් ලෙස සියයට 50 සිට සියයට 83 දක්වා වූ පරාසයක විය. | -එම-. | <u>ජාතික ඉතිරි කිරීමේ බැංකුව / මහජන බැංකුව</u><br>ශ්‍රී ලංකා මහබැංකුව විසින් නියම කර ඇති BASEL III අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් පවත්වා ගෙනයාම කෙරෙහි මූලිකත්වය දී කටයුතු කිරීම අත්‍යවශ්‍ය බැවින් එම ආයතනයන්ගෙන් අපේක්ෂා කළ දායකත්වය ලබා ගැනීමට නොහැකි විය. එමෙන්ම අනෙකුත් ආයතනයන්හි පැවති ද්‍රවශීලතා ගැටලු සහ පාස්කු ප්‍රහාරයේ බලපෑම හේතුවෙන් අපේක්ෂිත ආදායම රැස්කර ගැනීමට නොහැකි විය. |

| | | |
|---|---|---|
| (iii) ආයතන 02 ක ඇස්තමේන්තු ලාභ ආදායම පිළිවෙලින් රු.මිලියන 100 ක් හා රු.මිලියන 1,700 ක් වූ අතර තථ්‍ය ආදායම පිළිවෙලින් රු.මිලියන 250 ක් හා රු.මිලියන 2,300 ක් වීම හේතුවෙන් ඇස්තමේන්තුගත ලාභ ආදායමට සාපේක්ෂව තථ්‍ය ආදායමේ වැඩිවීම පිළිවෙලින් සියයට 150 ක් හා සියයට 35 ක් විය. | -එම- | පවත්නා මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධන තත්ත්වයන් යටතේ ඇස්තමේන්තුගත ආදායමට වඩා වැඩි ආදායම් රැස්කරගැනීමේ හැකියාවක් පැවතිනි. |
| (iv) ලංකා බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (National Institute of Business Management) සහ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සඳහා පිළිවෙලින් රු.මිලියන 10,000, රු.මිලියන 50, රු.මිලියන 75, රු.මිලියන 190, රු.මිලියන 12 හා රු.මිලියන 15 ක ආදායම් ඇස්තමේන්තු කර තිබූ අතර වර්ෂය තුල ඉන් කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර වෙතින් රජයට ආර්ථිකමය වාසියක් ලැබෙන පරිදි කටයුතු කරවීමට දෙපාර්තමේන්තුවේ අවධානය යොමු විය යුතුවේ. | ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ගැටළු හේතුවෙන් සහ ද්‍රවශීලතා ගැටලු හේතුවෙන් මෙම ආයතනවලින් කිසිදු ලාභ ප්‍රමාණයක් රැස්කර ගැනීමට නොහැකි වී ඇත. |
| (v) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ඛනිජ තෙල් සංස්ථාව පසුගිය වර්ෂ 03 කට අධික කාලයක සිට ලාභ ආදායමට කිසිදු දායකත්වයක් ලබා දී නොතිබුණි. | පාඩු ලබන ආයතනවල කාර්යක්ෂමතාවය වැඩි කිරිම සඳහා ප්‍රායෝගික වූ නිර්දේශ ඉදිරිපත් කිරිම උචිතවේ. | දිගින් දිගටම පාඩු ලබන මෙම ආයතන මගින් ආදායම් අපේක්ෂා නොකෙරේ. |

(ආ) **ආදායම් සංකේත 20.02.04-ලාභාංශ ආදායම**

| | | |
|---|---|---|
| (i) ආයතන 09 ක් සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත ලාභාංශ ආදායමට සාපේක්ෂව තථ්‍ය ආදායම ඉක්මවා තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 31 සිට සියයට 180 දක්වා පරාසයක් විය. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කළ යුතුවේ. | පවත්නා මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධන තත්ත්වයන් යටතේ ඇස්තමේන්තුගත ආදායමට වඩා වැඩි ආදායම් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | ආයතන 02 ක් සම්බන්ධයෙන් ලාභාංශ ආදායම් ඇස්තමේන්තු කර නොතිබූ නමුත් එම ආයතන 02 න් රු.මිලියන 14 ක් ලැබී තිබුණි. | ඇස්තමේන්තු සැකසීමට අවශ්‍ය තොරතුරු කාලීනව ලබාගත යුතුය. | ලාභාංශ ආදායම් ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී අදාල තොරතුරු නොලැබීම මත ඇස්තමේන්තුවලට ඇතුළත් නොවුවද අදාළ සමාගම්වලින් ලාභාංශ ආදායම් ලබා ගැනීමට කටයුතු කර ඇත. |
| (iii) | ආයතන 02 ක් සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත ලාභාංශ ආදායම රු.මිලියන 2,508 ක් වූ අතර තථ්‍ය ආදායම රු.මිලියන 1,725 ක් වූයෙන් ඇස්තමේන්තුගත ආදායමට වඩා තථ්‍ය ආදායමේ අඩුවීම සියයට 31 ක් විය. | ද්‍රවශීලතා ගැටළුවලින් මිදීම සඳහා උපාය මාර්ග නිර්දේශ කල යුතුවේ. | මෙම ආයතන වල පැවති ද්‍රවශීලතා ගැටලු සහ පාස්කු ප්‍රහාරයේ බලපෑම හේතුවෙන් අපේක්ෂිත ආදායම රැස්කර ගැනීමට නොහැකි විය. |
| (iv) | ආයතන 05 ක් පසුගිය වර්ෂ කිහිපයක් තුළම ලාභාංශ ආදායමට කිසිදු දායකත්වයක් ලබාදී නොතිබුණි. | -එම- | -එම- |
| (v) | 2019 වර්ෂය සඳහා ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, පරන්තන් කෙමිකල්, හලාවත වැවිලි සමාගම, ලංකා සීනි සමාගම, ලංකා ත්‍රිපෝෂ සමාගම සඳහා පිළිවෙලින් රු.මිලියන 3 ක් , රු.මිලියන 15 ක් , රු.මිලියන 25 ක් , රු.මිලියන 50 ක් , රු.මිලියන 75 ක් ලෙස ලාභාංශ ආදායම් ඇස්තමේන්තු කර තිබූ අතර වර්ෂය තුල ආදායම් සඳහා කිසිදු දායකත්වයක් ලබාදී නොතිබුණි. තවද, ලංකා පුත්‍ර සමාගම 2016, 2017 හා 2018 වර්ෂවලදී ලාභාංශ ආදායමට රු.මිලියන 118 කට අධික දායකත්වයක් ලබා දී තිබූ බවද නිරීක්ෂණය විය. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තු අනුව අංක 20.02.05.00 හා 20.03.02.20 යන බදු නොවන ආදායම් ශීර්ෂවල ආදායම් ගණන්දීමේ නිලධාරියා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස දක්වා ඇතත් එම ශීර්ෂ සඳහා ආදායම් ඇස්තමේන්තු සකස්කර නොතිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීමට නොහැකි නම් ශීර්ෂ ඇස්තමේන්තුවෙන් ඉවත් කිරීමට කටයුතු කළ හැකිවේ. | පිළිතුරු ලබාදී නොමැත. |

## 2.2 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයයන් 02ට අදාළව මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර වෙනස පිළිවෙලින් සියයට 65 හා සියයට 82 ක් දක්වා විය. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කිරීම උචිත වේ. | අනපේක්ෂිත ලෙස රාජකාරි ගමන් ඉහල යාම ලිපිද්‍රව්‍ය මිල ඉහල යාම සහ ඉල්ලුම වැඩි වීම මත එම වියදම් ශීර්ෂ සඳහා අමතර ප්‍රතිපාදන ලබා ගෙන ඇත. |
| (ආ) | වැය විෂය අංක 1409 සඳහා මූලික ඇස්තමේන්තුව මගින් රු.මිලියන 2 ක් සලසා තිබූ අතර පරිපූරක ඇස්තමේන්තු 3 ක් හා මු.රෙ.66 මාරුකිරීම් මගින් රු.මිලියන 1,582 ක ප්‍රතිපාදනද සලසාගෙන තිබුණි. එය මූලික වියදම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 79100 තරම් ඉහල අගයක් ගෙන තිබුණි. | -එම-. | 1409 වෙනත් වියදම් - ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අක්‍රිය ගිණුම් සඳහා ගෙවීම් කිරීමට රු.මි. 1582ක අමතර ප්‍රතිපාදන සලසා ගන්නා ලද අතර ඒ සඳහා ගෙවීම් කිරීමට අග්‍රිම නොලැබීම මත මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුලදී මූලධන වැය විෂයයන් 02 ක් සම්බන්ධයෙන් මූලික වියදම් ඇස්තමේන්තුවට සාපේක්ෂව සංශෝධිත වියදම් ඇස්තමේන්තුවෙහි වෙනස සියයට 695 ක් හා සියයට 1249 ක් විය. | -එම- | ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරන මිල ඉහල යාම සහ නවක නිලධාරින් පැමිණීම මත ඉල්ලුම වැඩි වීම මත එම වියදම් ශීර්ෂය සඳහා අමතර ප්‍රතිපාදන ලබා ගෙන ඇත. එමෙන්ම 2019 අයවැය යෝජනාවක් මගින් නවෝත්පාදනයන් දිරිගැන්වීම සඳහා වසර තුල රු. මිලියන 250 ක් වෙන්කර දී ඇත. මූලික ඇස්තමේන්තුවට ඇතුලත් නොවූ මෙම ප්‍රතිපාදනය අයවැය යෝජනාවක් මගින් ඇතුලත් කිරිමද හේතුවී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල වැය විෂයය අංක 1502 (විශ්‍රාමික ප්‍රතිලාභ) සඳහා මූලික ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා නොතිබූ අතර පරිපූරක ඇස්තමේන්තුව මගින් සලසා දී තිබූ රු.මිලියන 76 ක ප්‍රතිපාදනයෙන් සියයට 17 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මෙම වැය විෂයය අළුතින් ඇති කිරීම සඳහා මු.රෙ. 68 ප්‍රකාරව අනුමැතිය ලබා ඇති බවද නිරීක්ෂණය නොවීය. | -එම- | මූලික ඇස්තමේන්තුවට ඇතුලත් නොවූ මෙම ප්‍රතිපාදන පූගොඩ ටෙක්සටයිල් ආයතනයේ සේවක වන්දි ගෙවීම සඳහා වසර මැද දී වෙන්කර දී ඇත. |
| (ඉ) | මූලධන වැය විෂයයන් 4 කට අදාලව මුළු ශුද්ධ ප්‍රතිපාදනවල එකතුව රු.මිලියන 57 ක් වූ අතර ඉතිරිවීම් රු.මිලියන 53 ක් විය. ඒ අනුව ඉතිරිවීම් ප්‍රතිශතයන් සියයට 56 සිට සියයට 100 දක්වා පරාසයක විය. | -එම- | දෙපාර්තමේන්තුව නවීකරනය සඳහා මුදල් වෙන් කර ඇතත් එම වර්ෂය තුල වැඩ ආරම්භ නොවීම, ප්‍රසම්පාදන කටයුතු අවසන් නොවීම, ඉල්ලීම් නොමැති වීම, අපේක්ෂිත පුහුණු වැඩසටහන් නොපැවැත්වීම මත මෙම ප්‍රතිපාදන ඉතිරිව ඇත. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>------------<br>අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| (i) XII පරිච්ඡේදයේ 14.1.3 වගන්තිය | 2011-2013 දක්වා වර්ෂ 02 ක වැටුප් සහිත විදේශ නිවාඩු ලබා පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු නැවත වර්ෂ 06 කට පසු වර්ෂ 03 ක් සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ආචාර්ය උපාධියක් සඳහා විදේශ ගතවී තිබූ නමුත් ආයතන සංග්‍රහය ප්‍රකාරව ඒ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතු වේ. | එම නිලධාරියා ආචාර්ය උපාධිය සම්පූර්ණ කර වර්ෂ 10 ක අනිවාර්ය සේවා කාලයක් සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | -එම-. | නිලධාරියෙකු 2019 ජනවාරි 01 දින සිට 2021 පෙබරවාරි 14 දින දක්වා පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ඉල්ලුම් කර අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවී සිටියද 2019 දෙසැම්බර් මාසය වන විටත් ඒ සඳහා ආයතන සංග්‍රහය ප්‍රකාරව අනුමැතිය ලැබී නොතිබුණි. | -එම-. | එකඟ වෙමි. මුදල් අමාත්‍යාංශය 2020.09.08 දිනැති ලිපියෙන් අදාල අමාත්‍යාංශයට නිවාඩු අනුමත කර ගැනීමට ලිපියක් යවා ඇත. |
| | **(ii)** XV පරිච්ඡේදයේ 4 වගන්තිය | 2018 ජුනි මස 25 වන දින සිට 2018 අගෝස්තු 20 දින දක්වා ඉන්දියාවේ පැවැත් වූ මානව සම්පත් සැලසුම්කරණය හා සංවර්ධනය සම්බන්ධයෙන් වූ දින 56 ක පුහුණු වැඩසටහනක් සඳහා සහභාගි වීමට නිලධාරීන් දෙදෙනෙකුට වැටුප් සහිත නිවාඩු ලබාදී තිබූ අතර ආයතන සංග්‍රහය ප්‍රකාරව ඒ සඳහා ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | -එම-. | එකඟ වෙමි. ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කරන ලදී. අදාල නිලධාරීන් අනිවාර්ය අවම සේවා කාලය ඉක්මවා සේවය කර ඇති බව කාරුණිකව දන්වමි. |
| **(ආ)** | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 06 වන වගන්තිය | සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම තම ආයතනය යටතේ ඇති සියළුම වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත 2017 නොවැම්බර් 30 වන විට ඉදිරිපත් කළ යුතු බව දක්වා ඇති නමුත් එපරිදි කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. 2020 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ. |
| **(ඇ)** | 2010 දෙසැම්බර් 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 55 හි 07 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විගණන කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කලයුතු බව සඳහන් ඇත. එහෙත් ඇතැම් ආයතන වල විධායක මට්ටමේ නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කරන බව නිරීක්ෂණය විය. ඒ අනුව කමිටු ලේකම් තනතුර දරන අය අපක්ෂාතීව/ස්වාධීනව කටයුතු කරන්නේද යන්න විගණනයේදී ප්‍රශ්නගත විය. | පවත්නා චක්‍රලේඛවල අඩුපාඩු පවතීනම් ඒවා හඳුනාගෙන සංශෝධනය කිරීමට හා ආයතනයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳ නිරන්තර පසු විපරම් කල යුතු වේ. | රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ශක්තිමත් කිරීම සඳහා චක්‍රලේඛ නිකුත් කරනු ලැබේ. විගණන කමිටුවල ක්‍රියාකාරිත්වය හා ස්වාධීනත්වය වර්ධනය කිරීම හා සුරක්ෂිත කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත. නිසි පරිදි ක්‍රියාත්මක නොවේ නම් විගණකවරුන් (අභ්‍යන්තර /බාහිර) වාර්තා කළ යුතුවේ. |

**2.4 අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් දෙදෙනෙකුගෙන් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයවිය යුතු ණය ශේෂ රු.332,459 ක් සහ රු.75,845 ක් විය. | රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුවේ. | එක් නිලධාරියෙකුට විරුද්ධව නඩු පැවරීමට අදාළ ගොනු සකස් කරමින් පවතී. අනෙක් නිලධාරියා නීතිපති දෙපාර්තමේන්තුව විසින් එන්තරවාසි යැවූ නමුත් එකී ලිපිනය හැර ගොස් ඇති බව දන්වා ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මඟින් මූලික අරමුණු 3 ක් යටතේ වර්ෂය පුරා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සැලසුම් කර තිබුණි. එමඟින් දෙපාර්තමේන්තුවේ අමාත්‍ය මණ්ඩල සංදේශවල සඳහන් යෝජනා අධ්‍යයනය කිරීම සහ විශ්ලේෂණය කිරිම යන කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා වූ ක්‍රියාකාරකම් වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට ඇතුළත් කර නොතිබුණි. | සියළු කාර්යයන් ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරිමට කටයුතු කළයුතු වේ. | එකඟ වෙමි.<br>2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරිමට කටයුතු කර ඇත. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව තිබූ පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වී නොතිබුණි. | | |
| i. ක්‍රියාකාරී සැලැස්මේ 1.3 යටතේ දක්වා ඇති පරිදි රජය සතු ව්‍යාපාර විසින් ඉදිරිපත් කරන ලද පරිපාලන සංග්‍රහයන් (Administrative Manual) සඳහා අනුමැතිය ලබාදීම. | සැලැස්මට ඇතුලත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරිම දෙපාර්තමේන්තුවේ වගකීමක් වේ. | එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| | ii. රජය සතු ව්‍යාපාර වර්ගීකරණය (Categorization of SOEs) සඳහා අනුමත පරිපාටියක් සකස් කිරීම. | නැවත වර්ගීකරණයක් සිදු කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම උචිත වේ. | එවැනි යෝජනාවක් තිබුණද එවැන්නක අවශ්‍යතාවයක් නොමැති බව පෙනී ගිය හෙයින් පෙර පැවති වර්ගීකරණයම භාවිතා කරනු ලැබේ. |
| | iii. සමාගම් පනත, යහපාලන මාර්ගෝපදේශ විගණිත හා කළමනාකරණ කාර්යයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | මෙවැනි වැඩසටහන් පැවැත්වීම තුලින් ආයතනවල අඩුපාඩු/දුර්වලතා අවම කරගත හැකිවේ. | 2020 වර්ෂයේ දී මෙම වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. |
| | iv. 2019 වර්ෂයේ පළමු කාර්තුව තුළ අවසන් කිරීමට නියමිතව තිබූ ලාභාංශ ප්‍රතිපත්ති, ප්‍රසාද දීමනා ප්‍රතිපත්ති හා යහපාලන මාර්ගෝපදේශ, චක්‍රලේඛ හා පරිපාලන සංග්‍රහය සකස් කිරීමේ මාර්ගෝපදේශ නිකුත් කිරීම. | මාර්ගෝපදේශ නිකුත් කිරීම තුලින් ආයතනවල කටයුතු ක්‍රමවත් වේ. | එකඟ වෙමි. |
| | v. දෙවන කාර්තුවේදී අවසන් කිරීමට නියමිත ආදායම් ප්‍රතිපත්තිය සකස් කිරීම | සැලසුම් කළ පරිදි කටයුතු කිරිම දෙපාර්තමේන්තුවේ වගකීමක් වේ. | පිළිගනිමි.<br>2020 වර්ෂයේදී අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | ගිවිසුම්වලට එළඹි ආයතනවල කාර්යසාධනයේ අපේක්ෂිත මට්ටම හා ලඟා කර ගෙන ඇති කාර්යසාධනය සහ අපේක්ෂිත මට්ටමින් සත්‍ය කාර්යසාධනය වෙනස් වන විට එයට බලපාන ලද හේතු සාධක දක්වමින් අමාත්‍ය මණ්ඩලයට සය මසකට (06) වරක් වාර්තා කිරීම දෙපාර්තමේන්තුවට පැවරී ඇතත් මේ සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට දෙපාර්තමේන්තුවේ මෙහෙවර හා කාර්යයන් සියල්ලම අන්තර්ගත විය යුතුවේ. | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2019 ක්‍රියාකාරී සැලැස්ම තුලට රජය සතු වැවිලි සමාගම් වල ඉඩම් අතුරුබදු දීමේදී, කළමනාකරණ ගිවිසුම් වෙනස් කිරීමේදී හා වෙනත් පාර්ශවයන් සමඟ ගිවිසුම් ගතවීමේදී රන් කොටස් හිමිකරුගේ අනුමැතිය ලබාදීම සඳහා සලකා බැලිය යුතු කරුණු ඇතුළත් මාර්ගෝපදේශයක් සකස් කිරීම ඇතුළත් කර තිබුණි. | වර්ෂය තුල අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ වගකීමකි. | එකඟ වෙමි.<br>අදාල මාර්ගෝපදේශ සංග්‍රහයේ කෙටුම්පත 2019.12.02 දිනැති ලිපිය මඟින් වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය වෙත යොමු කර ඇති අතර අවසානයේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට තීරණය කරන ලද බැව් කාරුණිකව දන්වා සිටිමි. |

එහෙත් 2019 වර්ෂය තුළ එම කාර්ය නියමිත පරිදි අවසන් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.2 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ පිළියෙල කරන ලද 2018 වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාවේ දක්වා ඇති පරිදි රජය සතු වානිජ ව්‍යවසායන්හි කාර්යසාධනය සඳහා දෙපාර්තමේන්තුවේ නිර්දේශ ඉදිරිපත් කිරීම වෙනුවට වෙනත් ආයතන/රජය ගෙන ඇති ක්‍රියාමාර්ග සඳහන් කර තිබුණි. තවද ක්‍රියාත්මක කලයුතු නිර්දේශ ඍජුව හා පැහැදිලිව දක්වා නොතිබූ අවස්ථාවන්ද 2017 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් දෙන ලද නිර්දේශ එපරිදිම 2018 වර්ෂයේදීද ලබාදී තිබූ අවස්ථා ද නිරීක්ෂණය විය. | රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය සඳහා වූ නිර්දේශ ප්‍රායෝගික, කාලීන හා උචිත විය යුතු වේ. | මෙම වර්ෂයේ කාර්යසාධන වාර්තාව සකස් කිරීමේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. |
| (ආ) | රජය සතු වාණිජ ව්‍යාපාරවල මෙහෙයුම්, මූල්‍ය හා සේවා කටයුතුවල කාර්යසාධනය ඉහළ නැංවීමේ අරමුණින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2019 සැප්තැම්බර් 26 දින අංක PED 01/2019 දරන චක්‍රලේඛය යටතේ සාමූහික අභිලාශ ගිවිසුම් සම්බන්ධයෙන් වූ චක්‍රලේඛයක් හා මාර්ගෝපදේශයක් නිකුත් කර ඇති නමුත් චක්‍රලේඛයට අනුගතවීම් හා අදාල ගිවිසුම්වලට එළඹීම සඳහා පෙළඹවීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් පසුවිපරම් කර නොතිබුණි. | චක්‍රලේඛවලට කෙතරම් දුරට අනුගතවී ඇද්ද යන්න පසුවිපරම් කිරීම තුලින් අවබෝධ කර ගැනීම උචිත වේ. | එකඟ වෙමි.<br>නව රජය බලයට පත්වීමත් සමඟ 2019 වර්ෂයේ නව සාමූහික අභිලාෂ ගිවිසුම් තුලින් රාජ්‍ය ව්‍යාපාර වල කාර්ය සාධනය ඇගයීම සම්බන්ධයෙන් අනුමනය කල යුතු ක්‍රමවේදය පිළිබඳ අවසන් ප්‍රතිපත්තියකට පැමිණ නැති බැවින් PED 01/2019 චක්‍රලේඛය පරිදි රාජ්‍ය ව්‍යාපාර සමඟ සාමූහික අභිලාෂ ගිවිසුම් වල එළඹම් පිළිබඳව පසු විපරම් කිරීම සිදු නොකරන ලදී. |

| | | |
|---|---|---|
| (ඇ) 2019 දෙසැම්බර් 31 දිනට රජය සතු හඳුනාගන්නා ලද රාජ්‍ය ව්‍යාපාර 280 හි වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳ සලකා බැලීමේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යාපාර මඟින් නියමිත කාලරාමුව තුළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳ පසුවිපරම් සිදුකරනු ලැබුවද 2017, 2018 හා 2019 වර්ෂයන්හි පිළිවෙලින් ව්‍යාපාර 61,74 හා 98 ක් වාර්ෂික වාර්තා ඉදිරිපත් කර තිබූ අතර අධීක්ෂණය යටතේ වූ ආයතන වලින් ඉදිරිපත් නොවූ වාර්තා ප්‍රතිශතයන් ලෙස පිළිවෙලින් සියයට 77, සියයට 74 හා සියයට 65 ක් වී තිබුණි. | රාජ්‍ය ව්‍යාපාරවල වාර්ෂික වාර්තා ප්‍රමාදයකින් තොරව ගෙන්වා ගැනීමට කටයුතු කළයුතු වේ. | (i) එකඟ වෙමි. රාජ්‍ය ව්‍යාපාර ආයතනයන්හි වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳව ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා ඉදිරිපත් කරනු ලබන මුදල් අමාත්‍යාංශ නිරීක්ෂණ මඟින් සහ රාජ්‍ය ව්‍යාපාර ආයතන සෘජුවම ආමන්ත්‍රණය කිරීමෙන්ද තවදුරටත් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 6 කින් කිසිදු වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබූ අතර ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 5 කින් වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | - එම - | එකඟ වෙමි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සඳහා වාර්ෂික වාර්තා නියමිත කාලවකවානුව තුලදී ඉදිරිපත් කරන ලෙස ලිඛිතව අඛණ්ඩවම මෙම ආයතන දැනුවත් කර ඇතත්,ඒ සම්බන්ධව එම ආයතන විසින් නිසි පියවර ගෙන නොමැත. |
| (iii) 2019 මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාවට අනුව 2016, 2017 හා 2018 වර්ෂ සලකා බැලීමේදී ඉහත සඳහන් රාජ්‍ය ව්‍යාපාර 280 න් පිළිවෙලින් ආයතන 9 ක්, 20 ක් හා 37 ක් වශයෙන් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබූ බව විගණනයට නිරීක්ෂණය විය. | - එම - | එකඟ වෙමි. වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳව අධීක්ෂණ කටයුතු පුළුල් කිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. |
| (ඈ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු ලබන ප්‍රධානතම ආයතනය බවට පත්වීමේ දැක්ම සහිතව ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සිය අධීක්ෂණය යටතේ පවතින රාජ්‍ය ව්‍යාපාර වල පාලිත සමාගම් අධීක්ෂණය | දෙපාර්තමේන්තුවේ දැක්ම පරිදි රාජ්‍ය ව්‍යාපාරවල පාලිත සමාගම් අධීක්ෂණය සාර්ථක කිරීමට අවශ්‍ය පියවර ගත | එකඟ වෙමි. පාලිත සමාගම් අධීක්ෂණය/ කළමනාකරණය සම්බන්ධයෙන් මාර්ගෝපදේශයක් කෙටුම්පත් කර ඇති අතර, ප්‍රතිපත්තිය |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ වගකීම කාර්යභාර්ය හා නිර්නායකයන් පිළිබඳව 2019 වර්ෂය අවසන් වන විටත් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. | යුතුවේ. | ක්‍රියාත්මක කිරිමට අනුමැතිය ලැබීමෙන් අනතුරුව එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඉ) | පාලිත සමාගම්වල ඉහල කළමනාකාරීත්වය සම්බන්ධ කරගනිමින් පවත්වන ලද වැඩමුළුවේ පසුවිපරම් ක්‍රියාවලිය සඳහා හඳුනාගෙන තිබූ පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් පාලිත සමාගම්වල මූල්‍ය හා වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් පැහැදිලි උපදෙස් නිකුත් කර නොතිබුණි. තවද පාලිත සමාගම් විසින් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයන් කොතරම් දුරට අදාළ කරගත යුතුද යන්න පිළිබඳවද පැහැදිලි ලෙස නිර්වචනය කිරීම් ද 2019 දෙසැම්බර් 31 දින වනවිටත් ක්‍රියාවට නංවා නොතිබුණි. | පාලිත සමාගම්වල මූල්‍ය වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ වගකීම ඉටු කළ යුතුවේ. | - එම - |